# සගම රජමහා විහාරයට අයත් ''බුදු මඟුල'' නම් චාරිත්‍රය පිළිබඳ ඓතිහාසික හා මානව විද්‍යාත්මක විමර්ශනයක්

**නිපුනිකා ඩබ්ලිව්.ඒ.ටී[1], අතුකෝරාල ඒ.සී.ඩී.[2]**

ශ්‍රී ලංකාවේ බෞද්ධ සිද්ධාන්ත ආශ්‍රිතව නිර්මාණය වී ඇති රජමහා විහාර සංකල්පයට අයත් විහාර පද්ධතියේ එක් එක් විහාරයන්හි ඒවාට ම ආවේණික පුද පූජා ක්‍රම රාශියක් පවතින බව හඳුනාගත හැකි ය. මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සගම රජමහා විහාරය එකී ප්‍රදේශයේ පවතින ජනශ්‍රැතික විශ්වාසයන්ට අනුව ලාංකේය රජමහා විහාර පද්ධතියේ පළමු පුරුකයි. එම විහාරය ආශ්‍රිතව වාර්ෂිකව පැවත එන්නා වූ 'බුදු මගුල' නම් චාරිත්‍රය, එකී විහාරයට ම ආවේණික වූ පුද පූජාවකි. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේදය ලෙස සගම රජමහා විහාරය ආශ්‍රිතව ක්ෂේත්‍රයීය අධ්‍යයනයක් ඔස්සේ 'බුදු මඟුල' සම්බන්ධ ජනශ්‍රැතික හා ලේඛනගත තොරතුරු ඇසුරින් ඓතිහාසික විමර්ශනයක් සිදු කෙරේ. ඉහත ක්‍රමවේදගත ව 'බුදු මඟුල' විමර්ශනය කිරීමෙන් එකී පිළිවෙත ආරම්භය, විකාශනය සම්බන්ධ ව ඓතිහාසික පාර්ශ්වයෙන් සහ එකී පිළිවෙත හා සබැඳි සමාජ, සංස්කෘතික, දේශපාලනික කරුණු ඔස්සේ මානව විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කිරීම මෙහි මූලික අරමුණ වේ. විහාරයට අයත් ගොඩමුන්න, බූටාවත්ත, කපුලියද්ද හා නුගලියද්ද යන සතර පේරුවේ දායක පිරිසගේ සහභාගීත්වයෙන් වසරකට වරක් සිංහල අලුත් අවුරුදු උදාවෙන් පසු එළඹෙන සත්වන දින ඇරඹෙන මල් පූජාව සතර පේරුවේ ගම් දෙකක දායකත්වයෙන් සිදු කර සත්වන දින 'බුදු මඟුල' සිදු කරනු ලැබේ. එකී චාරිත්‍ර පද්ධතියට 'කත් මාරුව', 'දාන උපකරණ රැස් කිරීම', සතර පේරුවේ දායක පුරුෂයන්ගේ පමණක් සහභාගීත්වයෙන් සිදු කරන දානය පිළියෙල කිරීම ආදී ආවේණික වත්පිළිවෙත් රැසක් අඩංගු වේ. රජමහා විහාර සංකල්පයේ සුවිශේෂීත්වය ප්‍රකට වන්නා වූ මෙකී පිළිවෙත සම්බන්ධයෙන් මෙතෙක් පැහැදිලි විමර්ශනයක් සිදු වී නොමැති අතර විශේෂත්වය වන්නේ 'සගම' රජමහා විහාරයට පමණක් ආවේණික ව මෙය අප්‍රකට ව පැවතීම යි. මෙකී පූජා විධිය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම ඔස්සේ රජමහා විහාර සංකල්පය හා සම්බන්ධ ආවේණික වත්පිළිවෙත්හි ඓතිහාසික පරිණාමය විමසා බැලීමට මෙන් ම ඒ සඳහා සාමාන්‍ය ජනයාගේ දායකත්වය යොමු වූ ආකාරය පමණක් නොව එය ක්‍රමයෙන් ජන දිවියේ සංස්කෘතිකාංගයක් වූ ආකාරය විමර්ශනය කළ හැකි ය. තවද මෙහි පවතින ඇතැම් පිළිවෙත් සම්බන්ධයෙන් විමසීමේදී උඩරට පැරණි විහාර ආශ්‍රිතව ආගමික වත් පිළිවෙත් සඳහා බලපාන ලද සමාජ ස්ථරායන ස්වරූප පිළිබඳව ද අධ්‍යයනය කළ හැකි අතර ම රජමහා විහාර ආශ්‍රිත ආවේණික පුද පූජාවන් සම්බන්ධ පුළුල් ගවේෂණයකට මග විවර කරගත හැකි ය.

**මුඛ්‍ය පද :** බුදු මගුල, සගම රජමහා විහාරය, සතර පේරුව, ආවේණික වත් පිළිවෙත්, රජමහා විහාර සංකල්පය

[1] පේරාදෙණිය විශ්වවිද්‍යාලය. thisaraninipunika97@gmail.com